කසළ බැහැර කිරීමට නියමිත කරන ලද දින පවතී. කරුණාකර කසළ බැහැර කිරීමේ කැලැන්ඩරය පරීක්ෂා කරන්න. කරුණාකර නියමිත දිනයේ **උදෑසන 8:30 වන විට** ඔබේ කසළ, කසළ එකතු කරන ස්ථානයට දැමීමට කටයුතු කරන්න.
කසළ එකතු කිරීමේ ස්ථාන පරිශීලකයන් විසින් කළමනාකරණය කරනු ලබන බැවින් කරුණාකර භාවිතා කිරීමට පෙර එකතු කිරීමේ ස්ථානයේ පරිපාලකයෙන් විමසන්න.

සම්බු දිස්ත්‍රික් නාගරික පාරිසරික සනීපාරක්ෂක සංගමය
කසළ බැහැර කරන ආකාරය

කරුණාකර නීති වලට අනුකූලව සහ නිවැරදිව කසළ බැහැර කරන්න.

ඔබට නම් කරන ලද කසළ බැහැය ගැටගැසීමට නොහැකි අවස්ථාවක කරුණාකර විශාල කසළ නිවසින් එකතු කර ගැනීමට අයදුම් කිරීම හෝ කසළ එකතු කිරීමේ ස්ථානයට කෙලින්ම රැගෙන ඒම සිදු කරන්න.

කසළ නිවැරදි ආකරයට වර්ග කරමින් ඔබගේ සහයෝගය ලබා දෙන්න.

සීමිත සම්පත් සහ පෘථිවිය ආරක්ෂා කිරීම සඳහා

ඔබ මිලදී ගන්නා සම්භර ප්ලාස්ටික් බෑග්, දහනය කල හැකි කසළ බැහැර කිරීමට භාවිතා කළ හැක.

සෙසේමියා මව්සුමෙවා මවෙළඳසැල, ප්‍රෝඩ් රෝම් ග්‍රූඩ් මාර්කට් සහ්ම්මු මවෙළඳසැල සිඟ් හවුස් යොකොහාමා මවෙළඳසැල

වෙබ් පිටුව
https://sankan.chiba.jp/wordpress/

කසළ වෙන් කිරීමේ පරිශීලකය
https://www.gomi-saku.jp/0321/

කසළ වෙන් කිරීමේ යෙදුම (ios අනුවාදය)
https://perze.jp/app/0291/ios/

කසළ වෙන් කිරීමේ යෙදුම (Android අනුවාදය)
https://perze.jp/app/0291/android/

දහනය කල හැකි කසළ

- මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය
  [වෙන දැම්මට පෙර ජලය මිරිකා හරින්න]
- සම්(ලෙදර්) භාණ්ඩ
  (සපත්තු, බෑග්, බදු පට් ආදිය)

- ප්ලාස්ටික් වර්ග
  (සෙල්ලම් බඩු, ෂැම්පු/සේදුම්කාරක සඳහා වන බහාලුම්, ෂීඩ්/එම්ඩ් ආදිය)
  ප්ලාස්ටික් ටැංකි තුළ දැවෙන වායුව ඉතිරි වීමේ අවදානමක් ඇති බැවින් දහනය කළ නොහැකි කසළ ලෙස බැහැර කරන්න.

- රබර් වර්ග
- කඩදාසි වර්ග
  (ඉවත දැමිය හැකි ඩයපර් වලින් අපද්‍රව්‍ය ඉවත් කරන්න)

- ලී භාණ්ඩ [සෙන්ටිමීටර් 10ක් හෝ ඊට අඩු ඝනකමකට සහ දිග සෙන්ටිමීටර් 30ක් හෝ ඊට අඩුවෙන් කැඩිවිලට කැපෙන්න]
  (ලී පුවරු, කූරු, අතු ආදිය)
- ස්ටයිරෝෆෝම් [කුඩා කැඩිලිවලට කපා බැගයකට දමන්න]

- වෙනත්
  (කුඩා කුෂන්, පිරවූ බෙත්තික්කන්, කපන ලද නඟණකොදු [පස ඉවත් කරන්න], ෂිගරට් කොට ආදිය)



සැ.යු
- ෂැම්පු, සේදුම්කාරක යනාදිය බැහැර කිරීමට පෙර ඒවායේ අන්තර්ගතය සියල්ල භාවිතා කරන්න.
- නිල් ෂීට් ආදී විශාල වස්තූන් සෙන්ටිමීටර 30 ක් හෝ ඊට අඩු කැඩිලිවලට කපන්න.

資源 ප්‍රතිචක්‍රියකරණය කළ හැකි කසළ

*ලෙස සලකුණු කර ඇති වර්ගය අනුව කසළ වෙන් කර ඒවා වෙන් වෙන් වශයෙන් බැග්වල දමන්න.
(ඉලක්ක අයිතම හැර අන්‍යකුත් අයිතම මිශ්‍ර කර ඇති අවස්ථාවල එම කසළ එකතු කරනු නොලැබේ.)

- කෑන් සහ වීදුරු බෝතල් (මිශ්‍ර කළ හැක)
  ◇ කෑන්: බීම වර්ග, ඔධාසාර ඇඩංගු ඒවා පමණි.
  ◇ වීදුරු බෝතල්: බීම වර්ග, ඔධාසාර, කුළුබඩු, ආහාර, ඖෂධ හෝ ආහාර පිසීමට ගන්නා තෙල් ඇඩංගු ඒවා පමණි.

*වීදුරු බෝතල් ළිඳී ඉවත් කළ යුතුය.
*කෑන් සහ වීදුරු බෝතල්වල ඇඩංගු ද්‍රව්‍ය ඉවත් කර ජලයෙන් සෝදා හරින්න.

සැ.යු: පළිඛෝධනාශක බෝතල් බැහැර කළ නොහැක.
පින් කළ භාණ්ඩ සහ රසකැවිලි පින් දහනය කල නොහැකි කසළ ලෙස බැහැර කළ යුතුය.
රූපලාවණ්‍ය ද්‍රව්‍ය ඇඩංගු බෝතල් දහනය කළ නොහැකි කසළ ලෙස බැහැර කළ යුතුය.

බෝතල් ළිඳ
- ප්‍රෝඡනය ළිඳී දහනය කල නොහැකි කසළ ලෙස බැහැර කරන්න.
- ප්ලාස්ටික් ළිඳී දහනය කල හැකි කසළ ලෙස බැහැර කරන්න.

- ප්ලාස්ටික් බෝතල්
  ◇ **බීම වර්ග සහ කුළුබඩු** ඇඩංගු වූ ප්ලාස්ටික් බෝතල් පමණි.
  1. **PET සංඥර්ශකය** සහිත විය යුතුය.
  2. ළිඳීය සහ ලේඛය ඉවත් කරන්න.
  3. අන්තර්ගතය ඉවත් කර ජලයෙන් සෝදන්න.

ෂැම්පු සහ සේදුම්කාරක වැනි බහාලුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

ප්ලාස්ටික් බෝතල් බැහැර කරන ආකාරය
1) ජලයෙන් සේදීම. 2) වෙන් කිරීම.
බෝතල් ළිඳී සහ ලේඛය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
ප්ලාස්ටික් බෝතල් ප්‍රතිචක්‍රියකරණය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

- ඇඳුම්
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බැගය හොඳින් ගැටගසන්න.)
  *යට ඇඳුම්, මේස් සහ ඉරුණු ඇඳුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.

- වෙනත් රෙදි වර්ග
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බැගය හොඳින් ගැටගසන්න.)
  *ඇඳ රෙදි, කර්ටන්, තුවා-බිඳුන්කාවි සහ *tanmono* පමණි.

- සඟරා
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බැගය හොඳින් ගැටගසන්න.)
  *පෙළපොත්, පොත් සහ ශබ්ද කෝෂ ද මේ සමග බැහැර කළ හැක.

- පුවත්පත්
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බැගය හොඳින් ගැටගසන්න.)
  *අත් පත්‍රිකා සහ දාන්වීම් පත්‍රිකා ද මේ සමග බැහැර කළ හැකිය.

- කඩදාසි ඇසුරුම්
  පාන වර්ග අන්තර්ගත වූ කඩදාසි ඇසුරුම් පමණි.
  තුනුළන පලයෙන් සෝදා හැර, ඇසුරුම කපා විවෘත කර වියළන්න.
  *අතුළුදා ඇයුමිනියම් සහිත ඇසුරුම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.



- සුදු පැහැති ආහාර තැටි (**සුදු පැහැති නොමිං ස්ටයිරෝෆෝම් වලින් සාදා ඇති**)
  ආහාර තැටි පමණි.
  පලයෙන් සෝදා, කහාදින් වියළන්න.
  *තැටි මත වර්ණ, අක්ෂර ආදී රටා ඇත්නම් සහ පිරිසිදු කිරීමට අපහසු නම් ඒවා දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.



- කාඩ්බෝඩ්
  තෙත් නොවන ලෙස තබන්න.
  (වැස්සට නොතෙමෙන ආකාරයට බැගය හොඳින් ගැටගසන්න.)

*වැක්ස් වැනි ආලේපන ගල්වා ඇත්නම් දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න
*ප්‍රමාණයෙන් විශාල ඒවා බැගයේ ප්‍රමාණයට කපන්න.



දහනය කළ නොහැකි කසළ

*සපෘකුණේ සඳහන් කර ඇති ලෙස කසළ වර්ගීකරණය කර වෙන් වෙන් වශයෙන් බැග්වලට දමන්න.
(කාණ්ඩියට අයුතු නොවන දේවල් බැග්වල මිශ්‍ර වී ඇති අවස්ථාවල, ඒවා එකතු කරනු ලොලැබේ.)

- ඇට් භාණ්ඩ සහ වීදුරු වර්ග
  (ආහාර ගන්නා පාත්‍ර, පිඟාන්, මේස් බඳුන්, රූපලාවණ්‍ය ද්‍රව්‍ය ඇඩංගු බෝතල්, බීදුණු බෝතල්, ජනෙල් වීදුරු, වීදුරු කැබලි, කණ්ණාඩි, කොප්පර පාත්‍ර ආදිය)

*වීදුරු වැනි බිඳුණු ද්‍රව්‍ය අනතුරුදායක බැවින් බැගයට දැමීමට පෙර කඩදාසියකින් ඔතන්න.

- කුඩා ගෘහ උපකරණ
  (ඉංජිනේ වාදක, රිංගුම් කෑම්කර්, සිප්කර්, වීඩියෝ කැමරා, ඔරලෝසු,විදුලි කේතල් ආදිය)

*උපකරණවල ඇති පුද්ගලික තොරතුරු මකා දමන්න.

- ලෝහ වර්ග සහ වෙනත්
  (ගෑස් ලිප් මේස, ගෑස් සිලින්ඩර්, පින්කල් ආහාර බඳුන්, රසකැවිලි අන්තර්ගත වූ පින්, භාජන, කේතල්, තුඩු, දිගු කිරීමේ රැහැන්, විදුලි රැහැන්, ප්ලාස්ටික් ටැංකි, වීඩියෝ පට, ස්ප්‍රේ පින්, ඕලැන්කට්, කූඹන්, ජලාශ්‍රය, කොංටිට ආදිය)

කුඩා කසළ බැගයෙන් පිටතට වීන් තිබීම ගැටලුවක් නොවේ

*ගෑස් සිලින්ඩර් සහ රූපලාවණ්‍ය ද්‍රව්‍ය අඩංගු ඉහිස වීන් ආදීයෙහි අන්තර්ගතය අවසන් වූ පසු භාවිතා කර කසළ බැගයට දමන්න

සැ.යු
- පින් කළ ආහාරවල අඩංගු ද්‍රව්‍ය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
- ඉතුරු වූ රූපලාවණ්‍ය ද්‍රව්‍යවල ගිනි නොගන්නා දේවල් රෙදි පොඟවා එය දහනය කළ හැකි කසළ ලෙස බැහැර කරන්න.
- නම් කරන ලද කසළ බැග්වලට දැමිය නොහැකි කසළ, විශාල කසළ ලෙස සැලකේ.

අන්තරායක කසළ

- භාවිතා කළ වියළි කෝෂ
- රසදිය උෂ්ණත්වමාන

- විදුලි බුබුළු , ප්‍රතිදීප්ත පහන්

දිගු ප්‍රතිදීප්ත පහන් කසළ බාගයෙන් පිටතට පැමිණ තිබීම ගැටලුවක් නොවේ

*විදුලි බුබුළු සහ ප්‍රතිදීප්ත විදුලි පහන් කඩදාසියක ඔතා නියමිත බැග්ඒලට දැමිය යුතුය.

- ජංගම බැටරි, ඉලෙක්ට්‍රොනික සිගරට්

*ලෝහ ස්පර්ශන කොටස් ටේප් හෝ වෙනත් ආකාරයකින් ඔතන්න.

- ලයිටර්

*ලයිටර් බැහැර කිරීමට පෙර එහි අන්තර්ගතය හිස් කරන්න.

- නියුණු නල

*ස්පේපර් කවර් වල නල වීන් එකකට දමා බැහැර කරන්න.
*පිහි ආදිය සඳහා තලය වසටී රෙද්දෙන් ඔතා 刃物（はもの）ලෙස සටහන් කරන්න.

විශාල කසළ

නිවසට පැමිණ එකතු කර ගැනීමට අයදුම් කරන්න

අයදුම් කිරීම:
☎0479-86-3516

- කසළ එකතු කිරීමේ දින නියම කර ඇති බැවින් කරුණාකර කසළ බැහැර කිරීමේ දින දර්ශනය පරීක්ෂා කරන්න.
- සංගමයේ බල සීමාව තුළ ජීවත් වන අයට මෙම සේවාව භාවිතා කළ හැකිය.
- විශාල කසළ යනු නම් කරන ලද බෑග් වලට අදාළ නොවන කසළ වේ.
- ව්‍යාපාරික කටයුතුවලින් බැහැර කරනු ලබන කසළ මෙයට අදාළ නොවේ.

භාවිතය සඳහා උපදෙස්

1) අයදුම්පත (කසළ එකතු කරන දිනට පෙර දින දහවල් වන විට වෙන්කරවාගෙන තිබිය යුතුය.)
කරුණාකර දුරකථනයෙන් ඔබගේ ලිපිනය, නම, සම්බන්ධතා තොරතුරු සහ ඔබ බැහැර කරන අයිතමය සහ අයිතම ගණන දන්වන්න.

2) විශාල කසළ ස්ටිකර් මිලදී ගෙන ඒවා විශාල කසළවල අලවන්න.
එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ස්ටිකර් ආවශ්‍ය යුතුය.
*විශාල කසළ ස්ටිකර්, කසළ බාග් ආදෝපිකරණ මෙළෙඳසැල් වලින් මිලදී ගත හැකිය.

3) කරුණාකර ඔබේ කසළ, එකතු කරන දින උදෑසන 8:30 වන විට ඔබේ ගෙවත්ත වැනි පාරට පෙනෙන ස්ථානයකට දමන්න.
*කරුණාකර එකතු කිරීමට නම් කරන ලද අයිතමවලට අමතර දේවල් ඒ සමඟ බැහැර නොකරන්න.

කසළ කෙලින්ම සංගමයට රැගෙන ඒම

අයදුම් කිරීම: ☎0479-86-3516

- නම් කරන ලද කසළ බැග් සහ විශාල කසළ ස්ටිකර් අවශ්‍ය නොවේ.
- ඔබගේ වාහනයේ කසළ ගොඩබැමේ වගකීම ඔබ සතුය.ඌර්ය මණ්ඩලයේ උපදෙස් පිළිපදින්න.
- ගෑස්වල අතු ආදිය ෂැම්පු සෙන්ටිමීටර් 10 ට වඩා අඩු , දිග මීටර් 1 ක් විය යුතු අතර දිනකට වොන් 1 දක්වා එකතු කරනු ලැබේ.
  කරුණාකර නිල් ෂීට් ආදිය රැගෙන ඒමට පෙර ඒවා සෙන්ටිමීටර 50ක ෂැම්පු වලට කපා ගන්න.
- එක් දිනක් තුළ තනනී විශාල ප්‍රමාණයක් රැගෙන පැමිණෙන අවස්ථාවල, එයට ඕෂා පැනවීමට ඉඩ ඇත.
- කරුණාකර පවිතන ලද අයිතම ඉක්මනින් වාහනයෙන් බාගැනීමට පහසු වන පරිදි ඒවා වෙන් කිරීමට කටයුතු කරන්න.
- මියගිය සුරතල් සතුන් ද රැගෙන යා හැකිය.

රැගෙන එන දිනය	සඳුදා සිට සිකුරාදා (ඔසර අවසානය,අලුත් අවුරුදු නිවාඩු දින හැර)	සෑම මසකම 2 වන සතියේ ඉරිදා දින
රැගෙන එන වේලාව	පෙ:ව 9 සිට 11 , ප:ව 1 සිට 4 දක්වා	පෙ:ව 9 සිට 11 *සවස් කලයේ රැගෙන යා නොහැක.
වෙන් කිරීම් සිදු කරන ආකාරය	පෙර දින දුරකථනයෙන් වෙන් කරවා ගැනීම අවශ්‍ය වේ. *පෙර දිනය වන්නේ ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක් නම්, විකාම පෙර සෙසාඹුරාදා හාල් සාජේ දිවයාන වෙන්කරවා ගැනීම සිදු කරන්න.	සඳුදා සිට සිකුරාදා දක්වා (නිවාඩු දින හැර) දුරකතනයෙන් කලින් වෙන් කර ගත යුතුය. *සති ඊකට පෙර සිට වෙන් කර ගත හැක.
ගෘහ්තු	•කසළ බැහැර කිරීම: කිලෝ ග්‍රෑම් 10 කට යෙන් 100 (කිලෝ ග්ර්.ම් 10 ට අඩු වුවද යෙන් 100) •මියගිය සුරතල් සතුන්, මළ සිරුරකට යෙන් 500	

සංගමයට විසින් එකතු නොකරන කසළ

*කරුණාකර විශේෂඥ සමාගමක් සම්බන්ධ කරගන්න.

කෘෂිකාර්මික ද්‍රව්‍ය (කෘෂිකාර්මික වයිනයිල්, විශාල කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ, පළිඛෝධනාශක, පළිඛෝධනාශක බහාලුම්, රසායනික බහාලුම්) , ගෘස් සිලින්ඩර්, වාහන අමතර කොටස්, වාහන තෙල්, බැටරි, ටයර්, ඇළ, ගිනි නිවන උපකරණ, විශාල වාණිජ විදුලි උපකරණ, තීන්ත, සිරිත්ත්ර, සිරිත්ර්ර කටු, පියානෝ, ඉදිකිරීම් අපද්‍රව්‍ය, ගඩොල්, උළු, පෙට්ටල්, ඩීසල්, භූමිතෙල්, 50cc ට වැඩි යතුරුපැදි, පස්, කොංක්‍රීට්, පරිගණක ආදිය.

ගෘහ උපකරණවල ප්‍රතිචක්‍රීකරණය කිරීමේ නීතියට යටත් අයිතම

*සංගමය මඟින් එකතු කළ නොහැක.

•ගෘහ උපකරණ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ නීතිය 2001 අප්‍රේල් 1 දින සිට බලාත්මක වූ අතර, එමගින් **වායු සම්කරණ, රූපවාහිනී, ශීතකරු, අධිශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර සහ රෙදි වියළන යන්ත්‍ර** ප්‍රතිචක්‍රීකරණය කිරීම අනිවාර්ය කරන ලදී.
(ඒවා කසළ එකතු කරන ස්ථානයකට බැහැර කිරීමට හෝ සංගමයට රැගෙන යාමට නොහැකිය.)



ප්‍රතිචක්‍රියකරණය සිදු කරන ආකාරය

•කරුණාකර පහත කුම්චිත් එක් කුමයක් භාවිතා කරන්න.
1 වන කුමය : ඔබ අයිතමයේ භාණ්ඩය මිලදී ගත් සිල්ලරඅලෙවුලෙන් හෝ ඔබ නව භාණ්ඩයක් මිල දී ගන්නා වෙළඳසැලෙන් එය රැගෙන යන මෙන් ඉල්ලුම් කරන්න.
2 වන කුමය: කසළ්ක් කාර්යාලයේ ප්‍රතිචක්‍රීකරණ ගාස්තුව ගෙවීමෙන් පසු, අයිතමය සෘජුවම නියමිත එකතු කරන ස්ථානයට ප්‍රවාහනය කරන්න
3 වන කුමය : සංගමය විසින් බලපතුලාභී වෙළඳ සමාගමක් ඉල්ලා සිටින්න. (කරුණාකර ගාස්තු ආදිය සඳහා බලපතුලාභී වෙළඳ සමාගම් සම්බන්ධ කරගන්න.)

බලපතුලාභී වෙළඳ සමාගම්:
Shinko Sangyo ☎ 0479 (86) 5769　Gendai Kogyo ☎ 0479 (74) 7887

නම් කරන ලද එකතු කිරීමේ ස්ථාන	Eco-mine, 604-5 Tokura, Tomisato City, ☎ 0476 (94) 0050 Nippon Express, 1-8-7 Osaku, Sakura City, ☎ 043 (498) 0856 Nanso Transport Mobara Branch, 1193-1 Yamanne, Nagara-machi, Chosei District, ☎ 0475 (30) 7333

ප්‍රතිචක්‍රීකරණ යොමු ගාස්තුව (ප්‍රතිචක්‍රීකරණ ගාස්තුව නිෂ්පාදකයා අනුව වෙනස් වේ.)					
වායු සම්කරණ	රූපවාහිනී (අඟල් 15 හෝ ඊට අඩු)	රූපවාහිනී (අඟල් 16 හෝ ඊට වැඩි)	ශීතකරු, අධිශීතකරණ (170ළ හෝ ඊට අඩු)	ශීතකරු, අධිශීතකරණ (171ළ හෝ ඊට වැඩි)	රෙදි සෝදන යන්ත්‍ර රෙදි වියළන යන්ත්‍ර
එකකයක් යෙන් 990 සිට	එකකයක් යෙන් 1320 සිට	එකකයක් යෙන් 2420 සිට	එකකයක් යෙන් 3740 සිට	එකකයක් යෙන් 4730 සිට	එකකයක් යෙන් 2530 සිට

වැඩිදුර විස්තර

ප්‍රතිචක්‍රීකරණ ගාස්තු හෝ ගෘහ උපකරණ ප්‍රතිචක්‍රීකරණ නීතියට යටත් වේද යන්න පිළිබඳව ඔබට ගැටලු පවතී නම්, කරුණාකර ගෘහ උපකරණ සංගමයේ ගෘහ උපකරණ ප්‍රතිචක්‍රීකරණ විවුවර් ඔධ්‍යාස්ථානය (☎ 0120-319-640) අමතන්න.
වෙබ් පිටුව: https://www.rlc.aeha.or.jp

イラスト出典：経済産業省ウェブサイト　https://www.meti.go.jp
日本容器包装リサイクル協会

කසළ බැහැර කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

කරුණාකර දහනය කළ හැකි කසළ, දහනය කළ හැකි කසළ එකතු කරන ස්ථානයට සහ දහනය කළ නොහැකි, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ අනතුරුදායක කසළ, දහනය කළ නොහැකි කසළ එකතු කරන ස්ථානයට බැහැර කරන්න.
දහනය කළ නොහැකි, ප්‍රතිචක්‍රියකරණය කළ හැකි සහ අනතුරුදායක කසළ වර්ග අනුව එකතු කරනු ලැබේ, එබැවින් කසළ එකතු කිරීම සම්පූර්ණ කිරීමට දින කිහිපයක් ගත විය හැකිය.
දහනය කළ හැකි සහ දහනය කළ නොහැකි කසළ එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙනස් විය හැකි බව කරුණාවෙන් සලකන්න.
සුදුසුලං හෝ අධික හිම වැනි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් කසළ එකතු කිරීම කළ නොහැකි විය හැක.

කසළ සැකසුම් පහසුකම
සම්බු දිස්ත්‍රික් නාගරික පාරිසරික සනීපාරක්ෂක සංගමය
1149-1 Kanno, Matsuo-machi, Sammu City ☎ 0479-86-3516 පිළිගැනීමේ වේලාවන් 8:30-17:15

කසළ රැගෙන ඒමේ දිනය: සඳුදා සිට සිකුරාදා (නිවාඩු දින හැර)
කසළ රැගෙන ඒමේ වේලාව 9:00-11:00, 13:00-16:00
කසළ රැගෙන ඒමේ දිනය: 2 වන ඉරිදා කසළ රැගෙන ඒමේ වේලාව 9:00-11:00